ශ්‍රී ලංකා වරාය අධිකාරිය

තනතුරු පුරප්පාඩු

ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ඇති ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| **තනතුර, සේවා ශ්‍රේණිය** | **සුදුසුකම්** | **අනෙකුත් අනිවාර්ය අවශ්‍යතා** | **සටහන** | **වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය** | **සටහන** | **වයස් සීමාව** |
|---|---|---|---|---|---|---|
| නිරාවරණ කිමිදුම්කරු<br><br>සේවා ශ්‍රේණිය අර්ධ ශිල්පී 10 : 3 (SS3) | දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම<br><br>**සමග**<br><br>**පළපුරුද්ද**<br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක කිමිදුම්කරුවකු වශයෙන් වසර තුන (03) ක පළපුරුද්ද | බඳවාගැනීමෙන් පසු වසරක සේවා කාලය තුළ ගිනි නිවීම හා ගිනි වැළැක්වීම, සාමාන්‍ය ආරක්ෂාව - ප්‍රථමාධාර, පුද්ගල ආරක්ෂක ශිල්ප ක්‍රම, දිය මත ජීවිතාරක්ෂක පාඨමාලා හදාරා සහතික ඉදිරිපත් කළ යුතුය | i. ටග් යාත්‍රා හෝ භාරන යාත්‍රාවල භාවිතා කෙරෙන යන්ත්‍ර සූත්‍රවල ක්‍රියාකාරීත්වය හා ඒවායේ නඩත්තු කටයුතු පිළිබඳ මනා දනුම<br><br>ii. පිහිනීමේ හා කිමිදීමේ හැකියාව | 10 : 3 (SS3)<br><br>මූලික වැටුප් පියවර : රු.35845 /=<br><br>වාර්ෂික වේතනාධිකය : රු. 365/=<br><br>(දළ වැටුප මාසිකව රු. 111,000/= ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය | අවුරුදු 18 – 45 අතර විය යුතුය (රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.) |

| තනතුර,<br>සේවා ගණය | සුදුසුකම් | අනෙකුත් අනිවාර්ය අවශ්‍යතා | සටහන | වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය | සටහන | වයස් සීමාව |
|---|---|---|---|---|---|---|
| රියදුරු (වතුර බත්තල්)<br><br>සේවා ගණය<br>අර්ධ ශිල්පී<br>10 : 3 (SS3) | දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම<br><br>**සහ**<br><br>1907 ලෝන්ච් ආඥා පනත යටතේ ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන අශ්ව බල 250 ට නොඅඩු ධාරිතාවයකින් යුත් සහතිකය<br><br>**සමඟ**<br><br>**පළපුරුද්ද**<br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක බත්තල් රියදුරු හෝ ඒ හා සමාන තනතුරක වසර තුන (03) ක පළපුරුද්ද | බඳවා ගැනීමෙන් පසු වසරක සේවා කාලය තුළ ගිනි නිවීම හා ගිනි වැලැක්වීම, සාමාන්‍ය ආරක්ෂාව - ප්‍රථමාධාර, පුද්ගල ආරක්ෂක ශිල්ප ක්‍රම, පිළිබඳ පාඨමාලා හදාරා සහතික ඉදිරිපත් කළ යුතුය | i. පිහිනීමේ හැකියාව<br><br>ii. ඩීසල් මෝටර් කාර්මික කටයුතු පිළිබඳ දැනුම | 10 : 3 (SS3)<br><br>මූලික වැටුප් පියවර : රු. 35845/=<br><br>වාර්ෂික වේතනාධිකය : රු. 365/=<br><br>(දළ වැටුප මාසිකව රු. 111,000/= ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාළ සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය | අවුරුදු 18 – 45 අතර විය යුතුය (රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.) |

| **තනතුර, සේවා ගණය** | **සුදුසුකම්** | **සටහන** | **වැටුප් කේත අංකය හා වැටුප් පරිමාණය** | **සටහන** | **වයස් සීමාව** |
|---|---|---|---|---|---|
| ඩිගර් රියදුරු<br><br>සේවා ගණය අර්ධ ශිල්පී 10 : 3 (SS3) | දෙවරකට නොවැඩි වාර ගණනකදී භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හය (06) කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත්වීම<br><br>**සහ**<br><br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක් මගින් නිකුත් කරන ලද දොඹකර ක්‍රියාකරවීම පිළිබඳ සහතිකය හෝ වෘත්තියට අදාළ තෙවන මට්ටමේ ජාතික වෘත්තීය සුදුසුකම් සහතිකය (NVQ3)<br><br>**සමඟ**<br><br>**පළපුරුද්ද**<br>රජයේ හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ඩිගර් රියදුරු හෝ ඒ හා සමාන තනතුරක වසර තුන (03) ක පළපුරුද්ද | i. ටොන් 6 සිට 25 දක්වා නියමිත බර ප්‍රමාණය අනුව දොඹකර ක්‍රියාකරවීමට හැකියාව<br><br>ii. බර ප්‍රමාණයන් තක්සේරු කිරීම පිළිබඳ මනා දැනුම<br><br>iii. බර ප්‍රමාණයන් ඔසවන විටදී නිරාපද ප්‍රවේශම් ක්‍රියාමාර්ග පිළිබඳ අවබෝධය<br><br>iv. එන්ජින් යන්ත්‍ර පණ ගැන්වීමට සහ නතර කිරීමට හැකියාව<br><br>v. ජිබ් උපකරණ හැරවීමේ, එසවීම, පහත් කිරීම සහ බර එසවීමේ ක්‍රියාකරවීම් එකවර ක්‍රියාකරමින් වේගයෙන් දොඹකරය වැඩ කිරීමට හැකියාව<br><br>vi. සුළු සැකසීම්, අළුත්වැඩියා කිරීම, පූර්ව ක්‍රියාකරවීම හා පිරික්සුම් කිරීම පිළිබඳ දැනුම<br><br>v. දොඹකරය ක්‍රියාකරවීමේදී භාවිතා කරන සංඥා පිළිබඳව අවබෝධය | 10 : 3 (SS3)<br><br>මුලික වැටුප් පියවර : රු. 35845/=<br><br>වාර්ෂික වේතනාධිකය : රු. 365/=<br><br>(දළ වැටුප මාසිකව රු. 111,000 /= ක් පමණ වේ) | සෑම අයදුම්කරුවෙකු ම තනතුරට අදාළ සම්මුඛ හා ප්‍රායෝගික පරීක්ෂණයෙන් සමත් විය යුතුය | අවුරුදු 18 – 45 අතර විය යුතුය. (රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවනු ඇත.) |

**වෙනත්**

සෑම අයදුම්කරුවෙකුම,

i. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍යවන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
ii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.
iii. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව හෝ තනතුරට අදාළ වනුයේ නම් වෛද්‍ය පරීක්ෂණයෙන්ද සමත් විය යුතුය.
iv. මෙම තනතුර ස්ථිර තනතුරක් වන අතර සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයින්ගේ භාරකාර අරමුදලට හිමිකම් කියයි.
v. රාජ්‍ය හෝ රාජ්‍ය සංස්ථාවන්හි සේවයේ නියුතු අපේක්ෂකයින් තම අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තුමේන්තු / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තුමේන්තු / සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට සටහනක් තිබිය යුතුය.

**සැ.යු.**

2016.12.01 දිනැතිව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති 28/2016 චක්‍රලේඛ ප්‍රතිපාදන අනුව ඉහත බඳවාගැනීම් පරිපාටිවල තාක්‍ෂණික හා කාර්මික අංශවල තනතුරු සඳහා බඳවාගැනීමේදී වෘත්තීය සුදුසුකම් ලෙස NVQ 3 හෝ NVQ 4 හෝ සමඟ අධ්‍යාපන සුදුසුකම් ලෙස අ.පො.ස. (සා.පෙළ) හෝ අ.පො.ස. (උ.පෙළ) හෝ ඇතුළත් කර ඇති අවස්ථාවකදී NVQ 3 හා NVQ 4 සුදුසුකම් ලබා තිබීම පිළිවෙලින් අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග සමත්වීම හා සමාන ලෙස සලකා කටයුතු කරනු ලැබේ.

සම්පූර්ණ ජීවදත්ත ඇතුළත්ව උප්පැන්න සහතිකය, අනෙකුත් අදාළ අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් සහතික, සේවා සහතික වල පිටපත් සමඟ ඥාති නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම හා ලිපිනයන් සහිතව සකස් කරන ලද අයදුම්පත්‍රය ලියාපදිංචි තැපැලෙන් 2026.07.06 දිනට පෙර පහත දක්වා ඇති ලිපිනයට ලැබීමට සැලැස්විය යුතුය. තැපැලේදී අස්ථානගත වන හෝ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් පිළිබඳව ශ්‍රී ලංකා වරාය අධිකාරිය වග කියනු නොලැබේ. අදාළ **<u>අයදුම්පත් බහාලූ කවරයේ වම්පස ඉහළ කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.</u>**

**ප්‍රධාන කළමනාකරු (මානව සම්පත් සහ පරිපාලන),**
**මානව සම්පත් සහ පරිපාලන කොට්ඨාශය,**
**ශ්‍රී ලංකා වරාය අධිකාරිය,**
**කොළුපිටිය කඩේ,**
**කොළඹ 13.**